**XVII වන පරිශිෂ්ඨය**

චෝදනා පත්‍රයක ආකෘතිය

(විනය බලධරයා විසින්,චූදිත නිලධරයක් වෙත නිකුත් කරන චෝදනා පත්‍රයක ආකෘතිය)

01. ඔබ,.......................... හි..................... තනතුරේ සේවය කරමින් සිටින අතරතුර දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයන්ට / විද්‍යායතනයන්ට අදාල ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ ....... උපලේඛනයේ සඳහන්, සේවය පැහැර හැරීම සහ / හෝ විෂමාචාරය යටතේ ගැනෙන, පහත සඳහන් එක් වරදකට, වරදවල් කිහිපයකට හෝ සියළුම වරදවල් සිදු කිරීම හේතුවෙන්, ඔබ සේවයෙන් පහ කිරීමට හෝ වෙනත් අයුරකින් දඬුවම් නොකිරීමට හේතු ඇතොත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයන්හී/විද්‍යායතනයන්හී ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ............. උපඡේදයෙහි දක්වා ඇති ආකාරයට, එම කරුනු මා වෙත ලිඛිතව දැන්වීමට කටයුතු කළ යුතුය. ඔබගේ එම නිදහසට කරුණු දැක්වීම, මෙම චෝදනා පත්‍රය ඔබ වෙත ලැබී දින .................. තුලදී මා වෙත ලැබීමට සැලැස්විය යුතුවේ.

චෝදනා :

(i) .......................
(ii) .......................
(iii) ......................
(iv) ......................

02. ඉහතින් සඳහන් කොට ඇති චෝදනා ඔප්පු කිරීම පිණිස, පහත දක්වා ඇති සාක්ෂිකරුවන් සහ ලිපි ලේඛන උපයෝගී කරගනු ඇත.

සාක්ෂිකරුවන් :

(i) .......................
(ii) .......................
(iii) .......................
(iv) .......................

ලේඛන :

(i) .......................
(ii) .......................
(iii) ......................
(iv) ......................

03. ඔබ හට හෝ ඔබ වෙනුවෙන් පෙනී සිටින නිලධරයාට ඉහත 02 වන ඡේදයෙහි සඳහන් ලේඛන පරික්ෂා කිරීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා ආයතන ප්‍රධානියා එනම්, සභාපතිවරයා/උපකුලපතිවරයා/මණ්ඩපාධිපතිවරයා/අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන දිනයකදී, ඔහුගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් පසු, එම ලේඛන පරීක්ෂා කළ හැකිය. එම ලේඛනවල පිටපත් ඔබට අවශ්‍ය වන්නේ නම්, එකී ලේඛන අදාළ ආයතන ප්‍රධානියාගේ පූර්ව අවසරය ලබාගැනීමෙන් අනතුරුව, ආයතනය විසින් නියම කරනු ලබන ගෙවීමක් සිදුකොට ලබා ගත හැකි ය.

04. ඔබ වෙනුවෙන් පෙනී සිටීම සඳහා නිලධාරියෙකුගේ සේවය ලබා ගන්නේ නම්, එම නිලධාරියාගේ තනතුරු නාමය (ඔහු සේවයෙන් විශ්‍රාම ලත් තැනැත්තෙකු නම් ඔහුගේ කලින් තනතුරු නාමය තබා ගත හැකිය), ඔහුගේ කාර්යාලිය/පෞද්ගලික ලිපිනය සහ මෙහි අමුණා ඇති පෝර්මය උපයෝගී කර ගනිමින්, ඔබ වෙනුවෙන් පෙනී සිටීමට කැමැත්ත පළ කිරීමද සඳහන් කොට එම කරුණු මා වෙත දක්වා මාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. එසේ ඔබ වෙනුවෙන් පෙනි සිටින නිලධරයා, රජයේ නිලධාරියෙකු හෝ රජයේ සේවයෙන් විශ්‍රාමලත් නිලධාරියෙකු විය යුතු වේ.

05. ඔබගේ පිළිතුරු, විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ, 8.1 සහ 8.4 උපඡේදයෙහි සඳහන් ආකාරයට ලබාදිය හැකිය. ඔබට එරෙහිව නගා ඇති චෝදනාවලට, ඔබ නිවැරදිකරු යයි ප්‍රකාශ කරන්නේ නම් සහ ඔබගේ නිර්දෝෂභාවය ඔප්පු කිරීම සඳහා විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට ඉල්ලා සිටින්නේ නම්, ඒ සඳහා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 8.1 සහ 8.7 උපඡේදයන්හී සඳහන් පරිදිම විසින් විමර්ශන නිලධරයක් පත් කරනු ඇත. ඔබ වෙනුවෙන් පෙනි සිටිමට, නීතිඥවරයකුගේ සේවය ලබා ගැනිමට ඉල්ලුම් කරන්නේ නම්, ඔබගේ ඉල්ලිමට ආධාර වන පිලිගත හැකි කරුණු ඉදිරිපත් කළ යුතු ය.

06. ඔබගේ පිළිතුර, ඔබගේ අංශ ප්‍රධාන මාර්ගයෙන් නියමිත දිනයට පෙරාතුව මා වෙත නොලැබුනහොත්, ඔබට නිදහසට ඉදිරිපත් කිරීමට කරුණු කිසිවක් නොමැති සේ සළකා, ඒ අනුව කටයුතු කරනු ඇත.

07. කරුණාකර මෙම චෝදනා පත්‍රය ඔබ වෙත ලැබුණු බව, ඔබගේ අංශ ප්‍රධාන මාර්ගයෙන් මා වෙත දැන්වීමට කටයුතු කරන්න.

......................................                                                  .............................

විනය බලධරයා                                                  දිනය

(සභාපති/ උපකුලපති/අධ්‍යක්ෂක)

පිටපත් :     1.

2.

3.